**ශීර්ෂය 232 - බන්ධනාගාර දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1. තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය - 232 බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 15 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3. මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු ය.

## 1.4. මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 1.6.2.(අ) | පෙර වර්ෂයේ මූල්‍ය නොවන වත්කම්වල අවසන් ශේෂය සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම්වල ආරම්භක ශේෂ අතර වෙනසක් පැවතීම. | 1.6.1(අ)(i) |
| 1.6.2.(අ) (iv) | දෙපාර්තමේන්තුවේ නමට හිමිකම පවරාගෙන නොමැතිව ගිණුම්ගත කර ඇති ඉඩම් | 1.6.2(අ)(viii) |
| 1.6.3 | ණයගැති ශේෂ සම්බන්ධයෙන් තහවුරු කර ගැනීමට සාක්ෂි ඉදිරිපත් නොවීම | 1.6.2.(අ) |

## 1.6. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1. ගිණුම්කරණ අඩුපාඩු

(අ) දේපල පිරියත හා උපකරණ

දේපළ පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i.) 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම්වල ශේෂය රු.9,812,358,938 ක් වුවද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ ඒසීඒ - 6 ආකෘතිය (එස්ඒ - 82) සහ භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශනවල එස්ඒ 82 ආකෘතිය අනුව ආරම්භක ශේෂයන්වල වටිනාකම පිළිවෙලින් රු.9,866,493,587 ක් හා | 2021 වර්ෂයේ අවසන් ශේෂ සමග සසඳා බැලීමේ දී 2022 වර්ෂයේ ආරම්භක ශේෂයන් සමඟ වෙනස් වීම් පෙන්නුම් කරනු ලබයි. මෙම වෙනස්වීම සිගාස් පද්ධතියේ පවතින ගැටළුකාරී තත්ත්වයන් ලෙස හඳුනාගෙන ඇති අතර, ඒ සඳහා නිවැරදි කිරීම් සිදු කිරීම සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා | මූල්‍ය නොවන වත්කම්වල සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය පෙර වර්ෂයේ අවසන් ශේෂයට සමාන විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 10,036,552,452 ක් වූයෙන් පිළිවෙලින් රු. 54,134,650 ක් හා 224,193,514 ක වෙනසක් නිරීක්ෂණය විය. | කරමින් පවති. නිවැරදි කිරීමෙන් පසු ඔබ වෙත ඉදිරියේ දී දැන්වීමට කටයුතු කරමි. | |
| (ii.) | මූල්‍ය ප්‍රකාශනවල අඩංගු ඒසීඒ - 6 ආකෘතිය (එස්ඒ - 82) අනුව මූල්‍ය නොවන වත්කම්වල ආරම්භක ශේෂයට එකතු කිරීම් රු.143,777,803 ක් වුවද, විගණනයට ඉදිරිපත් කර ඇති භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශනවල එස්ඒ 82 ආකෘතියට අනුව එය රු.311,783,096 ක් වූයෙන් රු.168,005,293 ක වෙනසක් නිරීක්ෂණය විය. ආරම්භක ශේෂයට සිදු කළ එකතුකිරීම්වලට අදාළව උපලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | - එම - | මූල්‍ය ප්‍රකාශනවල ඒසීඒ - 6 ආකෘතිය (එස්ඒ - 82) හා විගණනයට ඉදිරිපත් කර තිබූ භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශනවල එස්ඒ 82 ආකෘතියට අනුව මූල්‍ය නොවන වත්කම්වල ආරම්භක ශේෂයට ගලපන ලද එකතුකිරීම් සමාන විය යුතුය.ඒවාට අදාළ උපලේඛන විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (iii.) | මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර ඇති එස්ඒ - 82 ආකෘතිය (ඒසීඒ - 6) ට අනුව මූල්‍ය නොවන වත්කම්වල අවසන් ශේෂය රු.10,223,624,941 ක් වුවද විගණනයට ඉදිරිපත් කර ඇති එස්ඒ - 82 ආකෘතිය අනුව එම ශේෂය රු.10,246,231,293 ක් වූයෙන් අවසන් ශේෂ අතර රු.22,606,352 ක වෙනසක් නිරීක්ෂණය විය. | - එම - | මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර ඇති එස්ඒ - 82 ආකෘතිය (ඒසීඒ - 6) හා විගණනයට ඉදිරිපත් කර ඇති එස්ඒ - 82 ආකෘතියේ අඩංගු මූල්‍ය වත්කම්වල අවසන් ශේෂ සමාන විය යුතුය. |
| (iv.) | මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර ඇති ඒසීඒ - 6 ආකෘතිය (එස්ඒ - 82) අනුව මූල්‍ය නොවන වත්කම්වල අවසන් ශේෂය හා දෙපාර්තමේන්තු සිගාස් වැඩසටහන අනුව මූල්‍ය නොවන වත්කම්වල අවසන් ශේෂයන් අතර රු.2,144,397 ක වෙනසක් නිරීක්ෂණය විය. | - එම - | මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර ඇති ඒසීඒ - 6 ආකෘතිය (එස්ඒ - 82) හා දෙපාර්තමේන්තු සිගාස් වැඩසටහන අනුව මූල්‍ය නොවන වත්කම්වල අවසන් ශේෂය සමාන විය යුතුය. |
| (v.) | විගණනයට ඉදිරිපත් කර ඇති එස්ඒ - 82 ආකෘතිය හා දෙපාර්තමේන්තු සිගාස් වැඩසටහන අනුව මූල්‍ය නොවන වත්කම්වල අවසන් ශේෂයන් අතර රු.20,461,955 ක වෙනසක් නිරීක්ෂණය විය. | - එම - | විගණනයට ඉදිරිපත් කර ඇති එස්ඒ - 82 ආකෘතිය හා දෙපාර්තමේන්තු සිගාස් වැඩසටහන අනුව මූල්‍ය නොවන වත්කම්වල අවසන් ශේෂය සමාන විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (vi.) | බන්ධනාගාර දෙපාර්තමේන්තුවට හිමිකම පවරා ඇති රු.460,940,000 ක් වටිනා අක්කර 36.34 ක ඉඩම් ගිණුම්ගත කර නොතිබුණි. | අක්කර 36.34 ක ඉඩම්වල හිමිකම පවරාගෙන ඇති වටිනාකම තක්සේරු කර තිබුණ ද, තක්සේරු වටිනාකම ගිණුම්ගත වී නොමැති අතර, මෙය 2023 අප්‍රේල් 24 වන දින ගිණුම්ගත කිරීමට කටයුතු කර ඇත. | මෙම ඉඩම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (vii.) | දෙපාර්තමේන්තුවේ නමට හිමිකම පවරාගෙන නොමැතිව රු.119,500,000 ක වටිනාකමින් යුත් අක්කර 44.4 ක ඉඩම් ගිණුම්ගත කර තිබුණි. | දෙපාර්තමේන්තුව නමට හිමිකම පවරාගෙන නොමැති ඉඩම්වල තක්සේරු වටිනාකම ගිණුම්ගත කර තිබූ අතර, මෙය ගිණුමෙන් ඉවත් කිරීමට කටයුතු කළ බව විගණනය වෙත දන්වමි. | දෙපාර්තමේන්තුව නමට හිමිකම පවරාගෙන නොමැති ඉඩම් ගිණුම්ගත කිරීමට පෙර හිමිකම පවරාගත යුතුය. |
| (viii.) | 2022 වර්ෂයේ සිරකරු සුභසාධක අරමුදලට පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කිරීම පිළිබඳ වැලිකඩ, මැගසින්, කොළඹ රිමාන්ඩ්, ගාල්ල හා බූස්ස යන බන්ධනාගාර ආයතනවල සිදු කළ නියැදි පරීක්ෂාවේ දී රු.1,397,399 ක් වටිනා විෂයයන් 30 කට අදාළ අයිතම 69 ක පරිත්‍යාග වත්කම් සිගාස් වැඩසටහනට ඇතුළත් කර නොතිබුණි. | බන්ධනාගාර ආයතනවල පාරිභෝජ්‍ය ද්‍රව්‍ය ගිණුම්ගත කිරීමට සියළු බන්ධනාගාර ආයතනවල බන්ධනාගාර අධිකාරීවරුන් දැනුවත් කර ඇති අතර, 2023 වර්ෂයේ සිට කාර්තුවෙන් කාර්තුවට ගිණුම්ගත කිරීමේ වාර්තා මූලස්ථානය වෙත ගෙන්වීමට කටයුතු කර ඇත. | දෙපාර්තමේන්තුවෙන් ලැබෙන සියළුම මූල්‍ය නොවන පරිත්‍යාග වත්කම් සිගාස් වැඩසටහනට ඇතුළත් කළ යුතුය. |

(ආ) **බැරකම්**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ඇමුණුම (III) හා (IV) යටතේ වන බැදීම් හා බැරකම් ප්‍රකාශය භාණ්ඩාගාරය විසින් නිකුත් කරනු ලබන බැදීම් හා බැරකම් ප්‍රකාශය සමඟ සැසඳී තිබිය යුතු වුවද මූල්‍ය ප්‍රකාශනයේ දක්වා තිබූ රු.1,823,707,456 ක බැදීම් හා බැරකම් වටිනාකම භාණ්ඩාගාර පොත් අනුව රු.932,372,486 ක් වීමෙන් රු.891,334,970 ක වෙනසක් නිරීක්ෂණය විය. | බැදීම් ඇතිකරන්නා අංශ කිහිපයක් එක් ආයතනයක ඇතත්, ඔවුන් සියල්ලටම සිගාස් පද්ධතියට පිවිස බැරකම් පිළිබඳ තොරතුරු ඇතුළත් කිරීමට ඇති ප්‍රායෝගික ගැටළුකාරී තත්ත්වය හා සිගාස් වැඩසටහනේ සමහර බැරකම් හා බැදීම් නිරවුල් කර ඇතත්, සිගාස් වැඩසටහනේ නිරවුල් නොවී ඇති බැරකම් ලෙස වසර ගණනාවක් පැවතීම මෙයට හේතුවයි. | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති බැදීම් හා බැරකම්වල වටිනාකම භාණ්ඩාගාර පොත්වල දැක්වෙන වටිනාකමට සමාන විය යුතුය. |

**(ඇ) විගණන සාක්ෂි නොවීම**

පහත සඳහන් ගණුදෙනු සම්බන්ධයෙන් විගණන සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) සමාලෝචිත වර්ෂයේ කාර්මික හා කෘෂිකාර්මික අත්තිකාරම් ගිණුමේ දක්වා ඇති රු.97,388,180 ක ලැබිය යුතු ශේෂයෙන් රු.25,990,192 ක ශේෂ තහවුරු කර ගැනීමට අවශ්‍ය සාක්ෂි. | 2015 වර්ෂයට පෙර බිල්පත් අස්ථානගතවී ඇති බැවින් එම අගයන් පිළිබඳ නිවැරදි සංඛ්‍යා ලේඛන ලබා ගැනීමට අපහසු වී ඇත. | ණයගැති සම්පූර්ණ ශේෂයම තහවුරු කර ගැනීමට අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |
| (ii) බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් සිගාස් වැඩසටහනට ඇතුළත් කරන ලද සිරකරු සුභසාධක අරමුදලේ රු.2,371,275 ක් වටිනා මූල්‍ය නොවන වත්කම් නිශ්චිතව භෞතිකව හඳුනාගෙන ගිණුම් පොත්වල වාර්තා කල බවට තහවුරු කිරීමට අවශ්‍ය සාක්ෂි | මධ්‍යම ගබඩාවට ලැබෙන සියලුම භාණ්ඩ සඳහා, භාණ්ඩ තොග ලැබීමේ නිවේදනය අනුව කටයුතු කිරීමට අනිවාර්යය කර ඇත. 2023 වර්ෂයේ සිට අදාළ කාර්තුවෙන් කාර්තුවට ගිණුම්ගත කිරීමේ වාර්තා මූලස්ථානය වෙත ගෙන්වීමට කටයුතු කර ඇත. | අදාළ සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (iii) බන්ධනාගාර දෙපාර්තමේන්තුව වෙත විවිධ ආයතන වෙතින් පවරා ගෙන තිබුණු වාහන 87 ක් සඳහා ලියාපදිංචි සහතිකය **(CR)** බන්ධනාගාර දෙපාර්තමේන්තුව නමින් ලබා ගැනීම සම්බන්ධ තොරතුරු | බන්ධනාගාර දෙපාර්තමේන්තුවට පවරා ගැනීම සඳහා අවශ්‍ය විස්තර ලබා ගැනීමේ අපහසුව නිසා ලියාපදිංචි සහතික දෙපාර්තමේන්තුව නමින් ලබා ගැනීමට නොහැකි වී ඇත. | ලියාපදිංචි සහතිකය බන්ධනාගාර දෙපාර්තමේන්තුව නමින් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1. ආදායම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ක්‍රියාත්මක වන සුභසාධන ආපනශාලා සහ අලෙවිසැල්වල සේවය කිරීම සඳහා දෙපාර්තමේන්තු නිලධාරීන් අනුයුක්ත කර තිබූ අතර ජලය හා විදුලිය වෙනුවෙන් ද වැය වන වියදම බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් දරනු ලබයි. නමුත් මෙම සුභසාධන ආපනශාලා සහ අලෙවිසැල් පවත්වාගෙන යාම වෙනුවෙන් | බන්ධනාගර ආයතනයන් හි ආරක්ෂක තත්ත්වය හේතුකොට ගෙන බාහිර නිලධාරීන් අපනශාලාවන් හි සේවයට යෙදවිය නොහැකි බැවින් ඒ සඳහා බන්ධනාගාර නිලධාරීන් සේවයේ යෙදවීම සිදු කරයි. බන්ධනාගාර නිලධාරීන්ගේ සුභසාධනය | මුදල් රෙගුලාසි 83 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

ලැබිය යුතු කුලී ආදායම් හඳුනාගෙන එම ආදායම් මුදල් රෙගුලාසි 83 ප්‍රකාරව රජයේ ආදායම් ශීර්ෂ අංක 05 හී ආදායම් සංකේත අංක 20-02-01-01 යටතේ බදු කුලී ආදායම් ලෙස රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. නියැදි පදනමක් මත සිදු කළ විගණන පරීක්ෂාවේ දී බන්ධනාගාර ආයතන 09 ක 2022 වර්ෂයේ මුල් මාස 06 තුළ මේවාට අනුයුක්ත බන්ධනාගාර නිලධාරීන් 27 දෙනෙකු වෙනුවෙන් වැටුප් හා වේතන වශයෙන් රු.7,528,306 ක මුදලක් බන්ධනාගාර දෙපාර්තමේන්තුව ගෙවා තිබුණි. මීට අමතරව මිනිස් දින 5,581 ක සිර ශ්‍රමය යොදාගෙන තිබූ අතර රැඳවියන් හට ආහාර ද්‍රව්‍ය හා සනීපාරක්ෂක දෑ අලෙවියෙන් පමණක් රු.104,827,723 ක ආදායමක් උපයා තිබුණි.

මුල්කොට ගෙන මෙම ආපනශාලා පවත්වාගෙන යනු ලබන අතර, ලබන ආදායම් සමස්ථ නිලධාරීන්ගේ සුභසාධනය අරමුණු කරගෙන ක්‍රීඩා හා සුභසාධන සංගම් වෙත බැරකරනු ලබයි.

## 2.2. වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය<br>---------------------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>------------------------------- | නිර්දේශය<br>------------ |
|---|---|---|
| (අ) මූලධන වැය විෂයයන් 05 ක් සඳහා සලසාගෙන තිබූ රු.111,875,000 ක ඇස්තමේන්තු ප්‍රතිපාදනවලින් රු.44,050,471 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබූ අතර එම ඉතිරිවීම සියයට 21 සිට සියයට 59 ක් දක්වා පරාසයක් තුළ පැවතුණි. | විගණනය මගින් කරනු ලබන නිරීක්ෂණය සමඟ එකඟ වන අතර, අදාළ වැය විෂයයන් යටතේ වූ ඉතිරිකිරීම් සම්බන්ධයෙන් පහත හේතු සාදක දැක්විය හැක.<br>• අපේක්ෂිත කාර්යය ඉටු කිරීම අවසන් නොවීම<br>• 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන අයවැය චක්‍රලේඛය පරිදි කටයුතු කිරීම<br>• වෙළඳපොල භාණ්ඩ හිඟය නිසා සැපයුම් සිදු කිරීමට නොහැකි වීම<br>• අත් මුදල් සැපයුම් සිදු නොකිරීම | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තු සකස් කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) එක් මූලධන වැය විෂයයක හා පුනරාවර්ථන වැය විෂයයන් 02 ක් සඳහා වෙන්කර තිබූ ප්‍රතිපාදනවලින් මුදල් රෙගුලාසි 66 යටතේ වෙනත් වැය විෂයයන් සඳහා මාරු කිරීමෙන් පසුව ද එම වැය විෂයයන් හි ශුද්ධ ප්‍රතිපාදනය මත තවදුරටත් ඉතිරිවීම් සියයට 18 සිට සියයට 100 ක් දක්වා පරාසයක් තුළ පැවතුණි. | විගණනය නිරීක්ෂණය සමඟ එකඟ වන අතර, මුදල් රෙගුලාසි 66 යටතේ මාරු කිරීම්වලින් පසුවද අදාළ වැය විෂයන් හි ප්‍රතිපාදන ඉතිරිවීමට හේතු වූ කරුණු පහත දැක්වේ.<br>• අක් මුදල් භාණ්ඩාගාර වෙතින් නොලැබීම හේතුවෙන් අපේක්ෂිත ආකාරයේ වියදම් දැරීමට නොහැකි වීම<br>• පසුගිය වර්ෂය තුළ කොවිඩ් වසංගත තත්ත්වය සැලකිය යුතු ආකාරයෙන් පාලනය වීම හේතුවෙන් අපේක්ෂිත ආකාරයෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමට අවශ්‍ය නොවීම<br>• 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන අයවැය චක්‍රලේඛය පරිදි කටයුතු කිරීම | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තු සකස් කළ යුතුය. |

## 2.3. නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | නිරීක්ෂණය<br>---------------<br>වටිනාකම (රු) | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| **(i)** මෝටර් වාහන පනතෙ 25(1) | - | වලංගු ආදායම් බලපත්‍රයක් නොමැතිව බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ වාහන 85 ක් ධාවනයේ යොදවා තිබීම. | වාහන 48 සඳහා අදායම් බලපත්‍ර ලබා ගැනීමට අදාළ කටයුතු සිදු කරමින් පවති. | වලංගු ආදායම් බලපත්‍රයක් ලබා ගෙන වාහන ධාවනයේ යෙදවිය යුතුය. |

**(ii)** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි

| | | | | |
|---|---|---|---|---|
| මුදල් රෙගුලාසි 210 | 1,014,415 | වට්ටම් ලබාගත හැකි සෑම අවස්ථාවකදීම එම වට්ටම් ලබා ගැනීමට හැකිවනු පිණිස කල් ඇතුව ගෙවීම් කළයුතු වුවත්, බන්ධනාගාර ආයතන 04 ක ගිණුම් 21 කට අදාළව 2022 වර්ෂයේ ජලබිල්පත් ගෙවීමේ දී වට්ටම් ලබා ගැනීමට අදාළ කාලය තුළ ගෙවීම් සිදු නොකිරීම නිසා වට්ටම් ලබා ගැනීමට නොහැකි වී තිබුණි. | අක්මුදල් නිදහස් කරන ප්‍රමාණය අනුව ගෙවීම් කිරීමට සිදු වීම නිසා බිල්පත් නිරාකරණය කිරීමේ දී සැලකිය යුතු කාලයක් ගතවන බැවින්, භාණ්ඩාගාරය දැනුවත් කර මේ සඳහා ක්‍රමවේදයක් සකස් කර ගැනීමට ඉදිරියේ දී කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි 210 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| මුදල් රෙගුලාසි 502(ආ) | - | දීර්ඝ කාලයක සිට පැවත එන පහත සඳහන් ලැබිය යුතු ණය ශේෂ අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම හිඟ බිල්පත්වලින් වැඩි ප්‍රමාණයක් 2015 වර්ෂයට පෙර ඒවා වේ. මෙම බිල්පත් සම්බන්ධයෙන් නිවැරදි සංඛ්‍යාලේඛන ලබා ගැනීමට අපහසු වී ඇත. | |
| | | • බන්ධනාගාරය විසින් රාජ්‍ය අංශයට සිදු කරන ලද විකුණුම් වෙනුවෙන් ලැබිය යුතු රු.97,836,732 ශේෂයෙන් වසර 20කට වඩා පැරණි | | මුදල් රෙගුලාසි 502(ආ)ප්‍රකාරව ලැබිය යුතු ශේෂ සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | රු.1,643,588 හා වසර 5 – 20 ත් අතර රු.24,310,986 ක ලැබිය යුතු ශේෂ.<br><br>• බන්ධනාගාරය විසින් පෞද්ගලික අංශයට සිදු කරන ලද විකුණුම් වෙනුවෙන් ලැබිය යුතු රු. 35,618 ක ශේෂයෙන් වසර 20 කට වඩා පැරණි රු. 19,034 ක් හා වසර10-20 ත් අතර රු.16,584 ක ලැබිය යුතු ශේෂ. | | නිවැරදි තොරතුරු ලබා ගැනීමට නොහැකි වී ඇති බැවින් අයකරගැනීමේ අපහසුතාවයක් පවති. |
| මුදල් රෙගුලාසි 571 | 82,801,855 | පොදු තැන්පත් ගිණුම් 04 කට අදාළ වර්ෂ 02 ඉක්මවූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු නොකිරීම. | මෙම ශේෂ සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීමට බන්ධනාගාර අධිකාරීවරුන්ට උපදෙස් ලබා දී ඇත. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| මුදල් රෙගුලාසි 751(1) | - | දෙපාර්තමේන්තුවට ලැබෙන සියලුම භාණ්ඩ වහාම බඩු ලේඛන පොතේ ඇතුළත් කළ යුතු වුවත්, නියැදි පදනමක් මත කරන ලද පරීක්ෂාවේ දී වැලිකඩ, මහර, කොළඹ රිමාන්ඩ්, නව මැගසින් හා | අදාළ නිවැරදි කිරීම් සිදු කරන ලෙසටත්, ද්‍රව්‍ය ගබඩාවට ලැබුණු වහාම ලේඛනවල සටහන් තබන ලෙස සියලුම ගබඩා භාරකරුවන් දැනුවත් කර ඇත. | මුදල් රෙගුලාසි 751(1) ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | වටරැක යන බන්ධනාගාර ආයතනවල මිලදීගන්නා අමු සලාක ද්‍රව්‍ය ආහාර වට්ටෝරු අංශයේ අමු ආහාර ලේඛනයේ පමණක් ඇතුළත් කර තිබුණි. | | |
| මුදල් රෙගුලාසි 756(6) | - | පෙර වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරි වර්ෂයේ ජුනි 15 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවල පොදු 47 වාර්තාවෙහි සඳහන් භාණ්ඩ සම්බන්ධයෙන් සුදුසු පරිදි කටයුතු කිරීම පිළිබඳ වාර්තා 2023 මැයි 25 දින තෙක් ඉදිරිපත් නොකිරීම හා 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂන වාර්තා ඉදිරිපත් කිරීම 2023 ජුලි 14 දින තෙක් ඉදිරිපත් කර නොතිබුණි. | 2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ කටයුතුවලට අදාළ පොදු 47 ලේඛනවල සඳහන් සියලු භාණ්ඩ සම්බන්ධයෙන් අදාළ ලේඛනයේ අක්ෂර අනුව කටයුතු කර ඇති බව විගණනය වෙත දැනුම් දෙමි. | මුදල් රෙගුලාසි 756(6) ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| මුදල් රෙගුලාසි 770(4) | - | බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ පවත්නා වාහන 44 ක් සම්බන්ධයෙන් අපහරණ කටයුතු සිදුකර නොතිබීම හා තවත් වාහන 19 ක් සම්බන්ධයෙන් අපහරණ කටයුතු සඳහා නිර්දේශ ලබාගෙන තිබුණ ද, මෙතෙක් අපහරණ | වාහන 07 ක්, වෙන්දේසි කිරීම සඳහා කටයුතු සිදු කරමින් පවතින අතර, තවත් වාහන 12 ක් දෙපාර්තමේන්තුව නමට පවරාගෙන අපහරන කටයුතු කටිනමින් සිදු කිරීමට කටයුතු කරනු ලබයි. | |

| | | | | |
|---|---|---|---|---|
| | | කටයුතු අවසන් නොකිරීම. | | |
| මුදල් රෙගුලාසි 780 | 522,272 | රජයේ වැඩ හා සේවාවන් ඉටුකිරීමේ දී අරපිරිමැස්මෙන් හා කාර්යක්ෂමතාවයෙන් යුතුව ඒවා ඉටුකිරීමේ අවශ්‍යතාවය ගැන සෑම දෙපාර්තමේන්තුවක්ම නිසි පරිදි සැළකිලිමත් විය යුතුය. නමුත් ඊට අනුගත නොවී කළුතර, වැලිකඩ හා බන්ධනාගාර මූලස්ථානය යන බන්ධනාගාර ආයතනවල 2022 වර්ෂය තුළ විදුලි බිල්පත් සඳහා ගෙවීම් සිදු කිරීමේ දී නියමිත කාලපරිච්ඡේදය තුළ නොගෙවීම නිසා දඩ මුදල් (අධිභාර) වශයෙන් ගෙවා තිබුණි. | අක්මුදල් නියමිත පරිදි නොලැබීම නිසා විදුලිබිල්පත් නියමිත කාල සීමාව තුළ ගෙවීමට නොහැකි විය. | මුදල් රෙගුලාසි 780 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2.4. අවිධිමත් ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ---------------------- | -------------------------------- | ------------ |
| වර්ග අඩි 1800 කට වඩා වැඩි ඉඩ ප්‍රමාණයක ගොඩනැගිලි හා අසීමිතව විදුලිය හා ජලය උපයෝගී කරගනිමින් අනුරාධපුර බන්ධනාගාරයේ සම්පත් යොදාගෙන සුබසාධන සංගමය මගින් පවත්වාගෙන යන අවන්හලක් මුවාවෙන් පුද්ගලික ව්‍යාපාර කටයුත්තක් ලෙස මහා පරිමාණ අවන්හලක් දීර්ඝ කාලයක සිට පවත්වාගෙන යනු ලබයි. මෙම අවන්හලෙන් කර්මාන්ත අංශයේ | අනුරාධපුර බන්ධනාගාරයේ සුභසාධන අලෙවිසැල පවත්වාගෙන ගිය බන්ධනාගාර නිලධාරියා අදාළ කටයුතුවලින් ඉවත්කර ඒ සඳහා වෙනත් නිලධාරියෙකු පත් කිරීමට කටයුතු කර ඇති අතර, විගණනය විසින් පෙන්වා දී ඇති කරුණු සම්බන්ධව | ආයතන සංග්‍රහයේ XLVII පරිච්ඡේදයේ 1:5 හා 1:11 වගන්තිවලට අනුව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| බේකරි නිෂ්පාදන ද්‍රව්‍ය දෛනිකව අලෙවි කිරීමෙන් ලබන ආදායම රු. 19,000 ක් වුවද, පාරිභෝගිකයන්හට වෙනත් භාණ්ඩ හා සේවා සැපයීමට අදාළව රු.300,000 ක ආසන්න ආදායමක් ඉපයීය හැකි වුවත්, ඒ සඳහා බිල්පත් නිකුත් කිරීමක් සිදු නොකරයි. අවන්හලේ දෛනිකව සිරකරුවන් 6 දෙනෙකුට වැඩි සංඛ්‍යාවක් සේවයේ යොදවා තිබුණු අතර, අවන්හලට අනුයුක්තව සේවය කරන බන්ධනාගාර නිලධාරියා වෙනුවෙන් 2022 වර්ෂයේදී වැටුප් හා දීමනා රු.707,241 ක් ගෙවා තිබුණි. ඉතා කුඩා ලාභ කොටසක් මාසිකව ඉපයූ ලාභ වශයෙන් සුබසාධක සංගමයට බැර කළද, රජයේ ආදායමට කිසිදු මුදලක් බැර නොකරයි. අවන්හලට අනුයුක්ත කර ඇති නිලධාරියා විසින් අධිශීතකරණ, ශීතකරණ, ගෘහ උපකරණ ආදී ඉතා වටිනාකමින් අධික ඉන්වෙන්ට්‍රි භාණ්ඩ රාශියක් අවන්හලට පුද්ගලිකව සපයා තිබුණි. | පරීක්ෂණය කර බලා වාර්තාවක් ලබා ගැනීම සඳහා අධිකරණ අමාත්‍යාංශයේ නියෝජිතවරයෙකුගෙන් සමන්විත කමිටුවක් පත් කිරීමට කටයුතු කර ඇත. අදාළ වාර්තාව ලැබීමෙන් පසු, ගන්නා ක්‍රියාමාර්ග පිළිබඳ විගණනය වෙත වාර්තා කිරීමට ඉදිරියේ දී කටයුතු කරන බව දන්වමි. | |

**2.5. අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම.**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ---------------------- | -------------------------------- | ------------ |
| මුදල් රෙගුලාසි 371(2) ප්‍රකාරව, ලබාගත් අත්තිකාරම් මුදලක් කාර්යය නිම කළ විගසම පියවිය යුතු වුවද, බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ විවිධ කාර්යයන් සඳහා අවස්ථා 11කදී ලබා දී තිබු රු.357,480ක අත්තිකාරම් මුදල්, මුදල් පිය විය යුතු දිනයේ සිට දින 18 ත් දින 236 ත් අතර කාලයක් ප්‍රමාද කර පියවා තිබුණි. | අත්තිකාරම් පියවීමේ යම් ප්‍රමාදයක් සිදු වී ඇති අතර, අදාළ කාර්යය නිම වූ වහාම අග්‍රිම පියවීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. | මුදල් රෙගුලාසි 371(2) ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2.6. බැංකු ගිණුම් මෙහෙයවීම්**

බැංකු ගිණුම් මෙහෙයවීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ අඩුපාඩු පහත දැක්වේ.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ---------------------- | -------------------------------- | ------------ |
| 2022 දෙසැම්බර් 31 දිනට බැංකු ගිණුම් 12 ක නිකුත් කළ දින සිට මාස 06 ඉක්මවූ බැංකුවට ඉදිරිපත් නොකරන ලද එකතුව රු.112,707 ක් වූ චෙක්පත් 24ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | 2023 මාර්තු මස බැංකු ප්‍රකාශනවලින් 2022 වර්ෂයට අදාළව නිරවුල් කිරීමට ඇති චෙක්පත් අගයන් මුදල් සම්බන්ධව රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරන ලෙස බන්ධනාගාර අධිකාරීවරුන්ට උපදෙස් ලබා දී ඇත. | මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කළ යුතුය |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1. බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කර්මාන්ත අංශයේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | -------------------------------- | ------------ |
| සමාලෝචිත වර්ෂය තුළ දී කර්මාන්ත ක්‍රියාත්මක වන බන්ධනාගාර ආයතන 18 ක් අතුරින් ආයතන 07 ක වැඩ අංශ 11 ක නිශ්පාදනයක් සිදුකර නොතිබුණි. බන්ධනාගාර ආයතන 05 ක නිශ්පාදනය 2021 වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂයේ සියයට 16 ත් සියයට 77 ත් අතර පරාසයක් තුළ අඩුවීමක් දක්නට ලැබුණු අතර, බන්ධනාගාර ආයතන 03 ක විකුණුම් 2021 වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂයේ සියයට 42 ත් සියයට 48 ත් අතර පරාසයක් තුළ අඩුවීමක් දක්නට ලැබුණි. | අමුද්‍රව්‍ය සපයා ගැනීම අපහසුව, සිර ශ්‍රමය ප්‍රමාණවත් නොවීම, භෞතික සම්පත්වල හිඟය, ආර්ථික අර්බුදය වෙනි හේතු මත නිශ්පාදන සිදු නොවීම, නිශ්පාදන අඩුවෙන් සිදු කිරීම හා විකුණුම් අඩු වීමට හේතු වී ඇත. | බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කර්මාන්ත අංශයේ අරමුණු ප්‍රමාණවත්ව ඉටුවන පරිදි කටයුතු කළ යුතුය. |

### 3.2. කාර්යභාරයන් ඉටු නොකිරීම.

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | -------------------------------- | ------------ |
| බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් රට තුල කවර හෝ අධිකරණයක අධිකාරී බලය යටතේ බන්ධනාගාරගත කරන ලද සෑම තරාතිරකම රැඳවියන් පිළිගැනීම සහ බන්ධනාගාර නීති රීති වලට අනුකූලව ඔවුන්ගේ ආරක්ෂාව, රැකවරණය හා පුනරුත්ථාපනය ප්‍රමාණවත් පරිදි සැලසීම හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට අදාළව බන්ධනාගාර තදබදය අවම කිරීම, නවීන තාක්ෂණය හඳුන්වා දීම, භෞතික සම්පත් වැඩි දියුණු කිරීම හා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කාර්යය භාරයන් අතරින් ප්‍රධාන වේ. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (අ) රැඳවියන් සඳහා අවශ්‍ය ඉඩකඩවල ඌනතාවය | | |
| පිළිගත් ජාත්‍යන්තර ප්‍රමිතීන් හා බන්ධනාගාර ආඥා පනතේ විධිවිධානයන්ට අනුකූලව හා අභ්‍යන්තර චක්‍රලේඛයන්ට අනුගතව රැඳවියන්ගේ | නිරීක්ෂණය සමඟ එකඟ වේ. බන්ධනාගාරගත වන රැඳවියන් ප්‍රමාණය දෛනිකව වැඩි වීම, වාට්ටු හා සිර මැදිරිවල ඉඩකඩ | පිළිගත් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව හා බන්ධනාගාර ආඥා පනතේ (54 අධිකාරීය) |

| | | | |
|---|---|---|---|
| | මානසික හා ශාරීරික යෝග්‍යතාවයන්ට ගැලපෙන ආකාරයට ප්‍රමාණවත් ඉඩ පහසුකම් තිබිය යුතු වුවත්, 2022 ජූලි 01 දින වන විට බන්ධනාගාර 14 ක පිරිමි රැඳවියන් සඳහා වර්ග අඩි 108,689 ක ඌන ඉඩකඩ ප්‍රමාණයක් පැවතුණි. | ප්‍රමාණවත් නොවීම සඳහා බලපා ඇත. එසේ වුවත් සැම විටම පිළිගත් ජාත්‍යන්තර ප්‍රමිතීන් හා බන්ධනාගාර ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීමට උපරිම උත්සහ ගනී. | 94 වගන්තිය යටතේ සකස් කරන ලද 179 රීතියට හා අභ්‍යන්තර චක්‍රලේඛ අනුව අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) | බන්ධනාගාර ධාරිතාවය අනුව රැඳවිය හැකි රැඳවියන් සංඛ්‍යාවට වඩා වැඩි සංඛ්‍යාවක් බන්ධනාගාරවල රඳවා සිටීම. | | |
| | 2022 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බන්ධනාගාර ධාරිතාවය අනුව රැඳවිය හැකි රැඳවියන් සංඛ්‍යාව 11,291 ක් වුව ද, එය ඉක්මවා රඳවා සිටි රැඳවියන් සංඛ්‍යාව 14,885 ක් විය. 2022 දෙසැම්බර් 31 දින වන විට එක් එක් බන්ධනාගාර ආයතන 27 ක සංඛ්‍යාත්මක තොරතුරු අනුව ධාරිතාවය ඉක්ම වූ රැඳවියන් සංඛ්‍යාවේ පරාසය 62 සිට 1,907 දක්වා ඉහළ අගයක් විය. | නිරීක්ෂණය සමඟ එකඟ වේ. බන්ධනාගාරගත වන රැඳවියන් ප්‍රමාණය දෛනිකව වැඩි වීම, වාට්ටු හා සිර මැදිරිවල ඉඩකඩ ප්‍රමාණවත් නොවීම සඳහා බලපා ඇත. එසේ වුවත් සැම විටම පිළිගත් ජාත්‍යන්තර ප්‍රමිතීන් හා බන්ධනාගාර ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීමට උපරිම උත්සහ ගනී. | පිළිගත් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව හා බන්ධනාගාර ආඥා පනතේ (54 අධිකාරීය) 94 වගන්තිය යටතේ සකස් කරන ලද 179 රීතියට හා අභ්‍යන්තර චක්‍රලේඛ අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | සනීපාරක්ෂක පහසුකම් ප්‍රමාණවත් නොමැතිවීම | | |
| | 2023 අප්‍රේල් 30 දින වන විට බන්ධනාගාර 27 ක වැසිකිළි 187 ක හිඟයක් පැවති අතර, දැනට තිබෙන වැසිකිළිවලින් ද 278 ක් අළුත්වැඩියා කළ යුතු තත්ත්වයේ පැවතුණි. | 2022 වර්ෂයේ සිව්වන කාර්තුවේ වැසිකිළි 46 ක් ඉදිකිරීමටත්, 291 අළුත්වැඩියා කිරීමටත්, ආබාධිත වැසිකිළි 36 ක් අළුත්වැඩියා කිරීම් හා ඉදිකිරීමට කටයුතු කර ඇත. | ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම් ලබා දිය යුතුය. |
| (ඈ) | සිරකරුවන් වර්ගීකරණයකින් තොරව රැඳවීම | | |
| | බන්ධනාගාර ආඥා පනතේ විධිවිධානයන්ට අනුකූලව රැඳවියන් කාණ්ඩවලට වෙන් කර රඳවා තබාගත යුතුය. නමුත් විගණනය විසින් බන්ධනාගාරවල සිදුකළ භෞතික පරීක්ෂාවල දී අවස්ථා 04 කදී රැඳවියන් 2,222 දෙනෙකු වර්ගීකරණයකින් තොරව රඳවා තැබීම නිරීක්ෂණය විය. | බන්ධනාගාරයේ ඉඩපහසුකම් ඇති ආකාරයට එක් එක් වර්ගයට අයත් සිරකරුවන් වෙන වෙනම තබා ගැනීමට බොහො සෙයින් කටයුතු කරනු ලබයි. | පිළිගත් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව හා අංක 2288/15 සහ 2022 ජූලි 12 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් සංශෝධනය කරන ලද බන්ධනාගාර ආඥා පනතේ (54 අධිකාරීය) 94 වගන්තිය යටතේ සකස් කරන ලද 178 රීතියට අනුව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඉ) සිර වාට්ටු, සිරකුටි හා සිර මැදිරි අබලන්ව පැවතීම. | | |
| අනුරාධපුර, කළුතර හා කෑගල්ල බන්ධනාගාරවල සිදුකළ භෞතික පරීක්ෂාවල දී අළුත්වැඩියා නොකළ අබලන් තත්ත්වයේ පැවතුනු ගොඩනැගිලි නිරීක්ෂණය වූ අතර මීට අමතරව වැලිකඩ බන්ධනාගාරයේ D හා වැපල් වාට්ටු පරිශ්‍රයන් ද අබලන්ව පැවතුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වේ. අබලන් ගොඩනැගිලි අළුත්වැඩියා සඳහා 2023 කෙටුම්පත් ඇස්තමේන්තු මගින් මේ වන විටත් ඉල්ලීම් කර ඇත. බොහෝ බන්ධනාගාර ආයතනවල ගොඩනැගිලිවල අළුත්වැඩියා කටයුතු සිදු කළ යුතු තත්ත්වයේ පැවතියද ලැබෙන ප්‍රතිපාදන හා අක්මුදල් මේ සඳහා ප්‍රමාණවත් නොවීම නිසාවෙන් ප්‍රතිපාදන උපරිම උපයෝජනය කරමින් ප්‍රමුඛතා පදනමක් මත ගොඩනැගිලි අළුත්වැඩියා කටයුතු සිදු කරනු ලබයි. | බන්ධනාගාරගත කරන ලද සෑම තරාතිරකම සිරකරුවන්හට බන්ධනාගාර නීතිරීතිවලට අනුකූලව ඔවුන්ගේ ආරක්ෂාව, රැකවරණය හා නඩත්තුව සැලසීම සිදුකළ යුතුය. |
| (ඊ) සිරකරුවන් පුනරුත්ථාපනය කිරීමට අවශ්‍ය මානව හා භෞතික සම්පත් ප්‍රමාණවත් පරිදි නොතිබීම නිසා විධිමත් පුනරුත්ථාපනයක් සිදු කිරීමට අවකාශ නොතිබීම | | |
| 2022 නොවැම්බර් 01 දින වන විට අධිකරණය මගින් පුනරුත්ථාපනය සඳහා නියෝග ලබාදී පුනරුත්ථාපන මධ්‍යස්ථාන වෙත යොමු කිරීමට අපේක්ෂාවෙන් මාස 06 කට වැඩි කාලයක් වැලිකඩ බන්ධනාගාරයේ රඳවා සිටි රැඳවියන් සංඛ්‍යාව 1,271 ක් විය. | නිරීක්ෂණය සමඟ එකඟ වේ. බන්ධනාගාර තුළ පවතින අධික තදබදය පුනරුත්ථාපන කාර්යයන් සාර්ථකව නිම කිරීම සඳහා අභියෝගාත්මක කරුණක් වී ඇත. බන්ධනාගාරගත රැඳවියන්ගෙන් වැඩි ප්‍රමාණයක් මත්ද්‍රව්‍ය සම්බන්ධ වරදවල් සඳහා සිරගත වූවන් වේ. මෙවැනි වරදකරුවන් වෙන් කර රඳවා පුනරුත්ථාපනය කිරීම සඳහා “අමදිවි රිද්ම” වැඩසටහන බන්ධනාගාර ආයතන 09 ක ආරම්භ කර ඇත. | පුනරුත්ථාපනය සඳහා අවශ්‍ය මානව හා භෞතික සම්පත් ප්‍රමාණවත් පරිදි සපයාගෙන සිරකරුවන් විධිමත් පරිදි පුනරුත්ථාපනය කල යුතුය. |
| (උ) සිරගතවූවන් නැවත නැවත සිරගත වීම | | |
| විගණනය විසින් නියැදි පදනමක් මත බන්ධනාගාර 05 ක සිදුකළ භෞතික පරීක්ෂාවේ දී 2022 ජනවාරි සිට අගෝස්තු මාසය අවසානය දක්වා කාලපරිච්ඡේදය තුළ නැවත නැවත බන්ධනාගාර ගත වී ඇති සිරකරුවන් 1,029 ක් විය. | ඉහත පරිදි විධිමත් පුනරුත්ථාපනයක් සිදු කිරීමට අවකාශ නොතිබීම නිසා මෙවැනි තත්ත්වයක් ඇතිවිය හැක. | නැවත නැවත සිරගත වීම අවම කිරීම සඳහා ශක්තිමත් හා ප්‍රමාණවත් පුනරුත්ථාපන ක්‍රියාවලියක් ඇති කිරීම. |

| | | |
|---|---|---|
| (ඌ) රසපරීක්ෂණ වාර්තා අධිකරණයට ඉදිරිපත් නොකිරීම නිසා සැකකරුවන් දීර්ඝකාලීනව බන්ධනාගාරගත වීම. | | |
| අධිකරණය මගින් බන්ධනාගාර ගත කර ඇති සැකකරුවන්ට අදාළව පොලීසිය විසින් රස පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ මත්ද්‍රව්‍ය සාම්පල්වලට අදාළ රස පරීක්ෂණ වාර්තා මෙතෙක් ඉදිරිපත් නොවීම නිසා 2022 දෙසැම්බර් 31 වන දිනට රක්ෂිත බන්ධනාගාරගත කර ඇති සැකකරුවන් සංඛ්‍යාව 5,676 දෙනෙකු විය. | රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව මඟින් මෙම සැක කරුවන්ගේ රස පරීක්ෂක වාර්තා ලබා දීම ප්‍රමාද වීම මත ඔවුන් දීර්ඝ කාලයක් බන්ධනාගාර ගතව සිටීමේ තත්ත්වය බන්ධනාගාර දෙපාර්තමේන්තුවට පාලනය කල හැකි තත්ත්වයක් නොවන බව පෙන්වා දෙයි. | කාලීන අවශ්‍යතාවයට ගැලපෙන පරිදි රැඳවියන් යහපත් පුරවැසින් ලෙස පිටත්වීමට අවශ්‍ය සමාජ පසුබිම සැකසෙන පරිදි කටයුතු කළ යුතුය. |
| (එ) සිරකරුවන්ගේ ආරක්ෂාව සම්බන්ධ ගැටළු | | |
| 2022 දෙසැම්බර් 31 දිනට බන්ධනාගාර උදෑසන විවෘතය අනුව රැඳවියන්ගෙන් සියයට 53 ක් මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් වන වැරදි සඳහා දඩුවම් විඳින හා සැක පිට රඳවා ඇති රැඳවියන් වේ. මෙම රැඳවියන්ගෙන් ද සියයට 68 ක් සැක පිට රඳවා ඇති රැඳවියන් වේ. මත්ද්‍රව්‍ය වැරදිවලට සම්බන්ධ බන්ධනාගාරගත රැඳවියන්ගෙන් බොහෝ දෙනෙක් මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහි වූවන් නිසා කවර ආකාරයකින් හෝ අවශ්‍ය මත්ද්‍රව්‍ය ප්‍රමාණය ලබාගැනීමට ඔවුන් උත්සහ කරනු ලබන අතර එවැනි තත්ත්වයන් වැලැක්වීමට බන්ධනාගාර නිලධාරීන්ට වැඩි අවධානයක් යොමු කිරීමට සිදුවන අතර ඒ සඳහා මානව සම්පත් ප්‍රමාණවත් පරිදි නොතිබීම නිසා බන්ධනාගාර අභ්‍යන්තර ආරක්ෂාව හා ක්‍රියාකාරීත්වයට ද එය බාධාවක් වී ඇත. | නිරීක්ෂණය සමඟ එකඟවේ. මේ සඳහා දැනට පිලියම් වශයෙන් දරුණු ගණයේ අපරාධකරුවන් බූස්ස අධිආරක්ෂිත බන්ධනාගාරයේ රැඳවීම, අගුණකොලපැස්ස, කළුතර, මීගමුව, මහර හා බෝගම්බර යන බන්ධනාගාරවල ආරක්ෂිත කැමරා පද්ධති ස්ථාපිත කිරීම, බන්ධනාගාර දෙපාර්තමේන්තුව තුළ හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකාය නමින් ඒකකයක් පිහිටුවීම, බන්ධනාගාර ආයතන සඳහා දුරකථන අවහිර කිරීමේ සංඥා පද්ධති සවි කිරීම වැනි ක්‍රම දැනට ක්‍රියාත්මක කරයි. | බන්ධනාගාරයේ මූලික අරමුණක් වන සිරකරුවන්ගේ අරක්ෂාව සැපයීමට බාධාවන වතාවරණයන් අවම කර ගැනීම සඳහා කටයුතු කළ යුතුය. |

**3.3. අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ රුපියල් මිලියන 221 ක් වූ කළමනාකරණ තොරතුරු පද්ධතිය ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2022 දෙසැම්බර් 31 දින වන විට රු.151,915,478 ක් දරා තිබුණි. තොරතුරු කළමනාකරණ පද්ධතිය බන්ධනාගාර | මෙම පද්ධතියට අවශ්‍ය යටිතල පහසුකම් හා මානව සම්පත් සපයා ගැනීමට නොහැකි වීම මත කටයුතු කාර්යක්ෂමව සිදු කිරීමට අපහසු වී ඇත. | ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ප්‍රමාණවත් පරිදි ලගාකර ගැනීමට කටයුතු කළ යුතුය. |

ආයතනයන් තුළ ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රධාන දොරටුව, සිර ලියාපදිංචිය, සිර මාරුවීම්, නිදහස් කිරීම් කටයුතු පමණක් සිදු කරනු ලබයි. විනය, කර්මාන්ත, පුනරුත්ථාපනය, සිර පුද්ගලික දේපළ කළමනාකරණය, අමුත්තන් පෙන්වීම හා ආහාර වට්ටෝරු අංශය ආදි කාර්යයන් මෙම තොරතුරු කළමනාකරණ පද්ධතිය උපයෝගී කරගෙන ඉටු නොකරයි.

### 3.4. ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| ---------------------- | -------------------------------- | ------------ |
| රැඳවියන්ගේ අයිතිවාසිකම් සම්මත ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුගතවන සේ ආරක්ෂා කිරීමටත්, රැඳවියන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමටත් විධිමත් අයුරින් රැඳවියන් පුනරුත්ථානය කිරීමටත් අපේක්ෂාවෙන් රුපියල් බිලියන 30.6 ක අපේක්ෂිත පිරිවැය මත බොරැල්ලේ පිහිටි වැලිකඩ බන්ධනාගාර සංකීර්ණය හොරණ මිල්ලෑව ප්‍රදේශයේ ප්‍රතිස්ථාපනය කිරීමේ ව්‍යාපෘතියක් සැලසුම්කර තිබුණි. මෙම ව්‍යාපෘතියට අදාළ පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තාව, සැලසුම් හා නිර්මාණ කටයුතු, අභ්‍යන්තර මාර්ග, ජලය හා විදුලිය ඇතුළු යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ කටයුතු සියයට 30 ක් පමණ නිම කර තිබුණද මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන චක්‍රලේඛය අනුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තාවකාලිකව අත්හිටුවා තිබුණි. | මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද අංක 03/2022 හා 2022.04.26 දිනැති චක්‍රලේඛය අනුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තාවකාලිකව අත්හිටුවා ඇත. | ක්‍රියාත්මක කිරීම අත්හිටුවා ඇති වැලිකඩ බන්ධනාගාර සංකීර්ණය හොරණ ප්‍රදේශයේ නැවත ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය ඉක්මනින් ආරම්භ කර ක්‍රියාත්මක කිරීම. |

### 3.5. මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| ---------------------- | -------------------------------- | ------------ |
| හංගිලිපොල කෘෂිකාර්මික ගොවිපොලේ ජලනල පද්ධතිය ස්ථාපිත කිරීම 2022 සැප්තැම්බර් 20 වන දින රු.656,728 ක වියදමක් දරා හංගිලිපොල එළිමහන් සිර කඳවුරේ කෘෂිකාර්මික ජලනල පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා ජල මෝටරයක් හා උපාංග මිලදී ගෙන තිබුණ ද මේ වන තෙක් අදාළ ජලනල පද්ධතිය ස්ථාපිත කර නොතිබුණි. | අදාළ ස්ථානයට විදුලිබල සපයා ගැනීමේ ගැටළුව මත ජලනල පද්ධතිය ස්ථාපිත කිරීමට නොහැකි වී ඇත. | ජලනල පද්ධතිය හැකි කඩිනමින් ස්ථාපිත කර ව්‍යාපෘතියේ ප්‍රතිලාභ හැකි ඉක්මනින් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.6. ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය<br>---------------------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>-------------------------------- | නිර්දේශය<br>------------ |
| --- | --- | --- |
| (අ) සහල් සැපයීම | | |
| (i.) සහල් කිලෝග්‍රෑමයක ප්‍රසම්පාදන මිල ප්‍රාදේශීය මිලට වඩා ඉහළ අගයක් ගැනීම. | | |
| 2022 ජූලි 18 දින සිට 2022 නොවැම්බර් 03 දින දක්වා කාලපරිච්ඡේදය තුළ වාර්ෂික ප්‍රසම්පාදනයන්ට අනුව සැපයුම්කරුවන් සහල් සැපයීමට අපොහොසත් වන අවස්ථාවන්හිදී බන්ධනාගාර විසින් ප්‍රාදේශීය මිලදී ගැනීම් යටතේ සහල් මිලදීගෙන තිබුණි. එසේ සිදුකළ අවස්ථා 21 කදී වාර්ෂික ප්‍රසම්පාදන මිලට වඩා සහල් කිලෝග්‍රෑමයක මිල අඩුවීම නිසා රු.3,079,304 ක වියදමක් ඉතිරිකර ගැනීමට හැකිවී තිබුණි. | මුදල් පසුව ලබාදෙන පදනම මත සහල් සැපයීමේ දී බැංකු අයිරා වෙනුවෙන් යම් ප්‍රතිශතයක් මිලට එකතු කර ඇති බැවින් ප්‍රාදේශීය මිලට වඩා ප්‍රසම්පාදන මිලෙහි වැඩි වීමක් සිදු වේ. ප්‍රසම්පාදන ක්‍රියාවලියේ දී මාස 3 කට වරක් මිල සංශෝධනය කිරීමක් සිදු කරනු ලබයි. | මුදල් රෙගුලාසි 128 (1) (ඒ) හා 156(7) ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii.) දේශීය තැම්බු නාඩු සහල් වෙනුවට විදේශීය තැම්බු නාඩු සහල් සැපයීම. | | |
| ❖ වැලිකඩ, නව මැගසින්, කොළඹ රිමාන්ඩ්, මහර, මීගමුව හා වටරැක යන බන්ධනාගාර ආයතනවල නියැදි පදනමක් මත සිදුකළ භෞතික පරීක්ෂාවේ දී වාර්ෂික ප්‍රසම්පාදන ගිවිසුම්වලට අනුව කොන්ත්‍රාත්කරුවන් විසින් දේශීය තැම්බු නාඩු සහල් සැපයිය යුතු වුවත්, ඒ වෙනුවට අවස්ථා 68 කදී විදේශීය තැම්බු නාඩු සහල් කිලෝග්‍රෑම් 413,593 ක් සපයා තිබුණි. | රටේ පැවති ආර්ථික අර්බුද තත්ත්වයේ දේශිය සහල් හිඟතාවය මත සැපයුම්කරුවන් විසින් ආනයනික සහල් සපයා ඇත. එවකට වෙළඳපොලේ පැවති මිල ගණන් අනුව ගැලපීම් කර වැඩිපුර ගෙවන ලද මුදල් අයකරගෙන ඇත. | මුදල් රෙගුලාසි 137 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| ❖ විගණන නිරීක්ෂණයෙන් පෙන්වා දීමෙන් අනතුරුව සැපයුම්කරුවන් විසින් දේශීය තැම්බූ නාඩු සහල් වෙනුවට කිලෝග්‍රෑම් 50 සහල් මිටි සඳහා දේශීය කවර යොදා විදේශීය තැම්බූ නාඩු සහල් සපයා තිබුණි. මේ | | |

ආකාරයෙන් වැලිකඩ, නව මැගසින් හා කොළඹ රිමාන්ඩ් යන බන්ධනාගාර ආයතනවල ගබඩාවලට සහල් කිලෝග්‍රෑම් 11,000 ක් සපයා තිබුණු අතර ඉන් කිලෝග්‍රෑම් 5,500 ක් ප්‍රයෝජනයට ගෙන තිබුණි.

(ආ) අමු හා වියලි සලාක ද්‍රව්‍ය සැපයීම

නියැදි පදනමක් මත සිදුකරන ලද භෞතික පරීක්ෂාවේ දී වාර්ෂික ප්‍රසම්පාදනයන්ට අදාළ භාණ්ඩ සැපයීම සම්බන්ධව පහත කරුණු නිරීක්ෂණය වේ.

| | | | |
|---|---|---|---|
| (i.) | වැලිකඩ, නව මැගසින්, කොළඹ රිමාන්ඩ්, මහර, මොණරාගල, මීගමුව, අනුරාධපුරය හා වටරැක යන බන්ධනාගාර ආයතනවල අමු සලාක ද්‍රව්‍ය සැපයීමේ දී වෙළඳපල මිල උච්චාවචනය වන අවස්ථාවලදී කොන්ත්‍රාත්කරුවන්ට වාසිදායක වන ආකාරයෙන් සැපයීම | බන්ධනාගාර ආයතනවලට අවශ්‍ය අමු සලාක ද්‍රව්‍ය පසුව ගෙවීම් පදනම් කරගෙන මිලදී ගන්නා අතර, අඛණ්ඩ සැපයීමේ කොන්දේසිය මත කොන්ත්‍රාත්කරුවන්ට කොන්ත්‍රාත්තුව ප්‍රධානය කරනු ලබයි. | මුදල් රෙගුලාසි 156(7) ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii.) | වැලිකඩ, මීගමුව හා කොළඹ රිමාන්ඩ් යන බන්ධනාගාර ආයතනයන්වලට අමු ආහාර සැපයීමේ දී සැපයුම්කරුවන් පිරිවිතරයන්ට නොගැලපෙන හා පාරිභෝජනයට නුසුදුසු අමු ආහාර ද්‍රව්‍ය සැපයීම | බන්ධනාගාර ආයතනවලට අදාළ ද්‍රව්‍ය සැපයීමේ දී ප්‍රසම්පාදන පිරිවිතරයන්ට අනුව පරීක්ෂා කර භාර ගැනීමට අවශ්‍ය උපදෙස් භාෂා තුනෙන්ම ලබා දී ඇති අතර, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් විසින් මෙම ද්‍රව්‍ය පරීක්ෂා කරනු ලබයි. | මුදල් රෙගුලාසි 137 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iii.) | වැලිකඩ, නව මැගසින්, මීගමුව හා කොළඹ රිමාන්ඩ් යන බන්ධනාගාර ආයතනවල සැපයුම්කරුවන් විසින් අමු සලාක ද්‍රව්‍ය සැපයීමේ දී නියමිත වේලාවට වඩා ප්‍රමාද කර දිනපතා අමු සලාක ද්‍රව්‍ය සැපයීම. | ප්‍රායෝගික හේතුන් නිසා ඇතැම් සැපයුම්කරුවන් භාණ්ඩ සැපයීමේ දී ප්‍රමාදයන් වන බව අපද නිරීක්ෂණය කරයි. එවැනි අවස්ථාවන් නිතර පුරුද්දක් වශයෙන් සිදු නොවීමට වගබලා ගන්නා ලෙස බන්ධනාගාර අධිකාරීවරුන් දැනුවත් කර ඇත. | මුදල් රෙගුලාසි 137 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3.7. වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ---------------------------- | ---------- |

(අ) ඉඩම්

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i.) | අක්කර 369.9 ක් වූ ඉඩම්වල හිමිකම බන්ධනාගාර දෙපාර්තමේන්තුව සතුව පැවතියද වටිනාකම තක්සේරු නොකිරීම නිසා ගිණුම්ගත කර නොතිබුණි. | මෙම ඉඩම් සඳහා තක්සේරු වාර්තා කඩිනමින් ලබා දෙන ලෙස අදාළ පළාත් තක්සේරු කාර්යාලවලින් හා රජයේ ප්‍රධාන තක්සේරුකරු වෙතින් ඉල්ලීම් කර ඇත. | බන්ධනාගාර දෙපාර්තමේන්තුවට හිමිකම තිබෙන ඉඩම්වල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |
| (ii.) | බන්ධනාගාර, සිරමැදිරි, එළිමහන් සිර කඳවුරු, පුනරුත්ථාපන මධ්‍යස්ථාන හා ගොවිපලවල් වශයෙන් බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් භාවිතයට ගෙන තිබුණු අක්කර 315.2568 ක් වූ ඉඩම් ප්‍රමාණයක හිමිකම පවරා ගැනීම, වටිනාකම තක්සේරු කිරීම හා ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | පවරා නොගත් ඉඩම් පවරා ගැනීමේ කටයුතු මේ වන විටත් කඩිනමින් සිදු කරමින් පවතින අතර, මේ සම්බන්ධයෙන් සියලුම බන්ධනාගාර අධිකාරිවරුන් දැනුවත් කර ඇත . | මෙම ඉඩම්වල හිමිකම පවරාගෙන වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය |

(ආ) තොග පාලනය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i.) | බන්ධනාගාරවල උපකරණ ගබඩාවන්හි භෞතික තොග පරීක්ෂාවේ දී රු.51,993 ක් වටිනා තොග අයිතම 07 ක ඌනතාවයක් ද රු.282,286 ක් වටිනා තොග අයිතම 18 ක අතිරික්තයක් ද පැවතුණි. | බන්ධනාගාර ආයතනවල ගබඩාව වෙත ලැබුණු ඒවා පොත්වල සටහන් නොකිරීම නිසා මෙම දෝෂය සිදු වී ඇති බැවින් නිවැරදි කිරීමට හා භාණ්ඩ ලැබුණු වහාම හා නිකුත් කළ වහාම අදාළ පොත්වල සටහන් කිරීමට නිවැරදි උපදෙස් ලබා දී ඇත. | තොග සම්බන්ධයෙන් ඌනතා හා විෂමතා කිසිවක් වෙතොත් මුදල් රෙගුලාසි 757(2) ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii.) | ලැබෙන සියලුම භාණ්ඩ වහාම බඩු ලේඛන හා තොග පොත්වල ඇතුළත් කළ යුතු වුවත්, වාරියපොල හා වටරැක බන්ධනාගාර ආයතනවල භෞතිකව පැවති විෂයයන් 74 කට අදාළව ඖෂධ ඒකක 115,764 ක ප්‍රමාණයක් තොග පොත්වල සඳහන් කර නොතිබුණි. | ඖෂධ සංයෝජක නිලධාරීන්ට මේ සඳහා අවශ්‍ය උපදෙස් ලබාදුන් අතර, මුදල් රෙගුලාසි ප්‍රකාරව තොගපොත්වල ඇතුළත් කරන ලදි. | මුදල් රෙගුලාසි 751(1) ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

(ඇ) නිශ්ක්‍රීය වත්කම්

| | | |
|---|---|---|
| නියැදි පදනම මත කරන ලද භෞතික පරීක්ෂාවේ දී බන්ධනාගාර ආයතන 07 ක විදුලි ජනක යන්ත්‍ර 02 ක්, CCTV කැමරා 107 ක්, ගිණි නිවීමේ උපකරණ 09 ක්, ගෑස් වායුව භාවිතයෙන් ආහාර පිසීමට ඇති උදුන් පද්ධතිය, විදුලි උදුනක් **(Oven),** කැසට් රෙකෝඩරයක් හා ඩී.වී.ඩී යන්ත්‍රය නිශ්ක්‍රීය වත්කම් වශයෙන් පැවතුණි. | අපහරණය කළ යුතු භාණ්ඩ අපහරණය කිරීමටත් අළුත්වැඩියා කළ යුතු තත්ත්වයේ ඇති භාණ්ඩ හඳුනාගෙන අළුත්වැඩියා කිරීමටත් කටයුතු කරන බව දන්වමි. | අක්‍රීයව පවතින වත්කම් සුදුසු පරිදි අළුත්වැඩියා කිරීම හෝ අපහරණය කිරීම සිදු කළ යුතුය |

(ඈ) ඌන උපයෝජිත වත්කම්

| | | |
|---|---|---|
| නියැදි පදනම මත කරන ලද භෞතික පරීක්ෂාවේ දී වටරැක හා තල්දෙන යන බන්ධනාගාර ආයතනවල බ්ලොග් ගල් මැෂින් 02 ක් ඌන උපයෝජිත වත්කම් වශයෙන් පැවතුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වේ. ඉදිරියේදී නිශ්පාදන ක්‍රියාවලිය සඳහා යොදාගනු ලබයි. | ඌන උපයෝජිත වත්කම් පූර්ණ ධාරිතාවයෙන් භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |

**3.8. පාඩු හා හානි**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වසර 10 කට වඩා වැඩි කාලයක සිට පැවත එන වාහන අනතුරු 103 ක් ඇතුළු සිද්ධීන් 108 කට අදාළ අලාභය රු.37,546,184ක් ද, වසර 05 සිට 10 අතර කාලයක සිට පැවත එන වාහන අනතුරු 71 ක් ඇතුළු සිද්ධීන් 72 කට අදාළ අලාභය රු.15,302,592 ක්ද, 2022 වර්ෂයේ වූ වාහන අනතුරු 25 ක් ඇතුළුව වර්ෂ 05 කට වඩා අඩු කාලයක සිට පැවත එන වාහන අනතුරු 92 ක් ඇතුළුව සිද්ධීන් 93 ක් සම්බන්ධ අලාභය රු.31,746,145 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 103(1) ප්‍රකාරව කටයුතු නොකර දිගින් දිගටම මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | මෙම සිද්ධීන්වලින් බහුතරයක අලාභය රක්ෂණ සමාගම් වෙතින් අයකරගෙන ඇති බව නිරීක්ෂණය කර ඇති අතර, එසේ පාඩු පියවා ගැනීමට කටයුතු කර ඇති සිද්ධීන් පොත්වලින් කපා හැරීම සඳහා පත්කර ඇති කමිටුව වෙත යොමු කිරීමට කටයුතු කරන බව විගණනයට දන්වමි. | වාහන අනතුරු ඇතුළු අලාභ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 103(1) හි සඳහන් පරිදි ක්‍රියාකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇමුණුම (1) යටතේ තවදුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු හා සිද්ධීන් 273 ක් අතුරින් 2017 සිට 2022 වර්ෂය අවසානය දක්වා සිදු වූ අලාභ 21 ක අලාභය තක්සේරුකර නොතිබුණි. | වාහන අනතුරු 21 කට අදාළව අලාභ හානි තක්සේරු වටිනාකම් ලබා ගැනීම සඳහා කටයුතු කර ඇති බව විගණනය වෙත දන්වමි. | වාහන අනතුරු ඇතුළු අලාභ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 103(1) හි සඳහන් පරිදි ක්‍රියාකළ යුතුය. |
| (ඇ) | මුදල් රෙගුලාසි 104(3) ප්‍රකාරව පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට දින 07 කට වඩා ප්‍රමාදයක් සිදු වේ යැයි අපේක්ෂා කරන්නේ නම් නැතිවීම් හා පාඩුවීම් සම්බන්ධව ප්‍රාරම්භක වාර්තාවක් වහාම එවිය යුතුය. නමුත් බන්ධනාගාර දෙපාර්තමේන්තුවට අදාළව දින 07 කට වඩා ප්‍රමාදයක් සිදු වී ඇති අලාභ හානි 253 ක් සම්බන්ධව මුදල් රෙගුලාසි 104(3) ප්‍රකාරව ප්‍රාරම්භක වාර්තාවක් ඉදිරිපත්කර නොතිබුණි. | අදාළ වාර්තා සියළුම ආයතනවලින් ගෙන්වා ගැනීමට කටයුතු කර ඇති බව දන්වමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය |

**3.9. අනාර්ථික ගණුදෙනු**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------------ | ---------------------------------- | ----------- |
| (අ) | බන්ධනාගාරවල ආරක්ෂාව මනා ලෙස පවත්වාගෙන යාම සඳහා බන්ධනාගාර පිවිසුම් දොරටුවල පවත්වාගෙන යන පොත්පත් ලේඛන තුළ පැමිණීම්, පිටවීම්වලට අදාළ සියලු විස්තර නිවැරදිව ඇතුළත්ව පවත්වාගෙන යනු ලබයි. ඒ අනුව බන්ධනාගාර රෝහල්වල සේවය කරන වෛද්‍යවරුන්ගේ පැමිණීම, පිටවීම ද විධිමත්ව එම පොත්පත් හා ලේඛනවල සටහන් කෙරේ. වෛද්‍ය නිලධාරීන්ගේ රාජකාරී දින පොතේ සඳහන් පැමිණීම, පිටවීම තොරතුරු පදනම් කරගෙන වෛද්‍ය නිලධාරීන්ට වැටුප් හා දීමනා ගෙවීම් සිදුකිරීමේ දී බන්ධනාගාර පොත්වලට අනුව වෛද්‍ය නිලධාරීන් සේවයට වාර්තා නොකළ කාලයන් ද සේවයට වාර්තා කළ කාලය සේ සලකා ගෙවීම් කර තිබුණි. විගණනය විසින් සිදුකරන ලද නියැදි පරීක්ෂාවේ දී 2022 වර්ෂයේ මාසයක් (මාර්තු/ මැයි/ ජූලි) තුළ බන්ධනාගාර ආයතන 05 ක රෝහල්වලට අනුයුක්තව සේවය කරන ශ්‍රේණිගත වෛද්‍යවරුන් 24 ක් හා ලියාපදිංචි වෛද්‍යවරුන් 09 ක් සඳහා රු.7,879,273 | | |

ක වැටුප් හා දීමනා වශයෙන් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| (i.) | සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ අංක 02-20/2014 හා 2014 පෙබරවාරි 05 දිනැති චක්‍රලේඛයට අනුව වෛද්‍යවරුන් සතියේ දිනවල දිනකට පැය 06 ක අවම කාලයක් සහ සෙනසුරාදා දිනයන් හි පැය 04 ක කාලයක් සේවය කළ යුතු වුව ද, ඉහත බන්ධනාගාර රෝහල්වලට අනුයුක්තව සේවයේ නියුතු වෛද්‍යවරුන් 33 දෙනෙකු මාසයක කාලපරිච්ඡේදයක් සඳහා මුළු මිනිස් පැය 4,570 ක් සේවය කළ යුතු වුව ද සේවය කර තිබුනේ මිනිස් පැය 1,296 යි මිනිත්තු 35 ක් පමණි. මෙම කාලපරිච්ඡේදය සඳහා කෙටි නිවාඩු, අර්ධ නිවාඩු හෝ සම්පූර්ණ නිවාඩු ලබාගෙන නොතිබුණි. | සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ 2003 පෙබරවාරි 14 දිනැති ලිපියට අනුව වෛද්‍ය නිලධාරීන්ගේ සහ ලියාපදිංචි වෛද්‍ය නිලධාරීන්ගේ දීමනා සහතික කිරීමේ දී එම වෛද්‍ය නිලධාරීන්ගේ රාජකාරී දින පොතට අනුව සහතික කළ යුතු බව දන්වා ඇත. ඒ අනුව වෛද්‍ය නිලධාරීන්ගේ පැමිණීම සටහන් වන ලේඛනය ලෙස වෛද්‍ය නිලධාරීන්ගේ රාජකාරී දින පොත පිළිගත් ලේඛනයක් වන බැවින් එයට අනුව වෛද්‍ය නිලධාරීන්ගේ අවම කාලය ආවරණය වන සේ සේවයේ යෙදීමත්, සේවයට නොපැමිණි ලෙස දක්වා ඇති දිනවල ඒ අනුව සේවට වාර්තා කර ඇති බවත් පෙන්වා දින හැක. | සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ අංක 02-20/2014 හා 2014 පෙබරවාරි 05 දිනැති චක්‍රලේඛයට අනුව කටයුතු කල යුතුය. |
| (ii.) | සෞඛ්‍ය අමාත්‍යාංශයේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක MA/MS/A/07/2021 හා 2021 ඔක්තෝබර් 11 දිනැති ලිපියට අනුව සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක 7/2001 (අ) හා 2001 අගෝස්තු 31 දිනැති චක්‍රලේඛයට අනුව සති අන්ත හා රජයේ නිවාඩු දිනයන්හි රාජකාරියට වාර්තා කිරීම වෙනුවෙන් නිවාඩු දින වැටුප් වශයෙන් මූලික වැටුපෙන් 1/20 දීමනාව ලබාගැනීම සඳහා අවම වශයෙන් දිනකට පැය 06 ක අඛණ්ඩ සේවාවක් ඉටුකළ යුතුය. නමුත් ඉහත බන්ධනාගාර රෝහල්වලට අනුයුක්තව සේවයේ නියුතු වෛද්‍යවරුන් 30 දෙනෙකු මාසයක කාලපරිච්ඡේදයක් සඳහා සති අන්ත සහ රජයේ නිවාඩු දිනයන්හීදී රාජකාරියට වාර්තා කළ මිනිස් දින 87 තුළ මිනිස් පැය 540 ක කාලයක් සේවය කළ යුතු වුව ද සේවය කර තිබුනේ මිනිස් පැය 133 යි මිනිත්තු 35 ක් පමණි. | වෛද්‍යවරුන් සඳහා ගෙවනු ලබන්නේ හදිසි ඇමතුම් රාජකාරී සඳහා වන දීමනාවක් වන අතර, එය අතිකාල දීමනාවක් නෙවන බවත් ඒ අනුව එක් එක් වෛද්‍යවරුන්ගේ හදිසි ඇමතුම් දිනයන් රාජකාරී දින පොතේ සඳහන් කර ඇති අතර, එහි දක්වා ඇති දිනයන් සඳහා පමණක් අදාළ දීමනා ඉල්ලුම් කර ඇත. | සෞඛ්‍ය අමාත්‍යාංශයේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක MA/MS/A/07/2021 හා 2021 ඔක්තෝබර් 11 දිනැති ලිපියට අනුව සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක 7/2001 (අ) හා 2001 අගෝස්තු 31 දිනැති චක්‍රලේඛයට අනුව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ 2014 වර්ෂයේ සිට 2022 වර්ෂ අවසානය දක්වාම ධාවනයට යොදා නොගන්නා වාහන 33 ක් රු.363,837 ක වියදමක් දරා 2023 ජනවාරි 01 දින සිට දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදයට වලංගු වන පරිදි රක්ෂණ ආවරණ ලබාගෙන තිබුණි. මෙම වාහන විගණන දිනය වන තෙක් ධාවනයට එක්කර නොතිබීම නිසා අනාර්ථික ගනුදෙනුවක් බව විගණනයට නිරීක්ෂණය විය. | අදාළ තත්ත්වයන් නිවැරදි කිරීමට කටයුතු කර ඇති බව විගණනයට දන්වමි. | මුදල් රෙගුලාසි 128 (1) (ඒ) අනුව වියදම් කරනු ලබන මුදල දරන්නා රජයට උපරිම වටිනාකමක් ලැබෙන බවට සහතික කිරීමට හැකි පරිදි කටයුතු කළ යුතුය. |

**3.10. කළමණාකරන දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | --------------------------- | ------------ |
| (අ) දඩ මුදල් ගෙවීමට නොහැකි වරදකරුවන් සිරගත කරන අතර, එම සිරකරුවන්ගේ දඩ මුදල් ගෙවා නිදහස් කිරීමේ නියෝගය ලද වහාම ඔවුන් සිරදඩුවමින් නිදහස් කළ යුතුය. නමුත් 2022 ජනවාරි සිට ජූනි දින දක්වා කාලපරිච්ඡේදය තුළ බන්ධනාගාර ආයතන 03 ක නිදහස් කිරීමේ නියෝගය ලද දිනය තුළ සිර දඩුවමින් මුදාහැර නොතිබූ අවස්ථා 46 ක් නිරීක්ෂණය විය. | පරිපාලන කටයුතුවල පවතින දුෂ්කරතා නිසා මුදාහැරීම ප්‍රමාදවන අතර මින් ඉදිරියට ඒ පිළිබඳ විශේෂ අවධානය යොමුකොට නියෝග ලද දිනයේම නිදහස් කිරීමට කටයුතු කරන බව දන්වමි. | නිදහස් කිරීමේ නියෝගය ලද වහාම වරදකරුවන් සිර දඩුවමින් නිදහස් කළ යුතුය. |
| (ආ) ඇප මුදල් ගෙවීමට නොහැකි රැඳවියන් බන්ධනාගාරගත කරන අතර, එම රැඳවියන් ඇප මුදල් ගෙවා නිදහස් කිරීමේ නියෝගය ලද වහාම ඔවුන් අත් අඩංගුවෙන් නිදහස් කළ යුතුය. නමුත් අගුණකොලපැලැස්ස හා මොණරාගල බන්ධනාගාරවල 2022 ජනවාරි 01 දින සිට 2022 ජූනි 30 දින දක්වා කාලපරිච්ඡේදය තුළ ඇප මුදල් ගෙවා නිදහස් කිරීමේ නියෝගය ලද දිනය තුළ අත් අඩංගුවෙන් මුදාහැර නොතිබූ අවස්ථා 291 ක් නිරීක්ෂණය විය. | පරිපාලන කටයුතුවල පවතින දුශ්කරතා නිසා මුදාහැරීම ප්‍රමාදවන අතර මින් ඉදිරියට ඒ පිළිබඳ විශේෂ අවධානය යොමුකොට නියෝග ලද දිනයේම නිදහස් කිරීමට කටයුතු කරන බව දන්වමි. | ඇප මුදල් ගෙවා නිදහස් කිරීමේ නියෝගය ලද දිනයේම අත්අඩංගුවෙන් මුදාහැරිය යුතුය. |
| (ඇ) අගුණකොලපැලැස්ස බන්ධනාගාරයේ දුරකථන සංඥා අවහිර කිරීමේ පද්ධතියේ සක්‍රීය ක්‍රියාකාරීත්වය බන්ධනාගාර ඇතුළත පරිශ්‍රය තුළ නොව ඒ අවට ඇති බාහිර ප්‍රදේශ තුළ ක්‍රියාත්මක වන බව විගණනයට අනාවරණය විය. මෙම තත්ත්වය තුළ | නිරීක්ෂණය සමඟ එකඟ වේ. දුරකථන සංඥා අවහිර කිරීමේ පද්ධතිය නිසියාකාරව ක්‍රියා නොකිරීම සම්බන්ධව ශ්‍රී ලංකා නාවික හමුදාව දැනුවත් කර කඩිනමින් යතාවත් කිරීමට | දුරකථන සංඥා අවහිර කිරීමේ පද්ධතිය ස්ථාපිත කිරීමේ අරමුණු ඉටුකර ගැනීම සඳහා නිසියාකාරව සංඥා අවහිර කිරීමේ පද්ධතිය |

| | | |
|---|---|---|
| බන්ධනාගාර පරිශ්‍රය අවට ජීවත් වන ජනතාව දැඩි අසීරුතාවයකට පත්ව තිබූ අතර අන්තර්ජාල භාවිතයෙන් අධ්‍යාපන කටයුතු කරන එම පවුල්වල දරුවන්ගේ අධ්‍යාපන කටයුතුවලට ද මෙය මහත් බාධාවක් වී තිබුණි. | කටයුතු කරනු ලබයි. | ක්‍රියාත්මක කළ යුතුය. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට අනුමත නිලධාරීන් සංඛ්‍යාව 7,872 ක් වූ අතර, තත්‍ය නිලධාරීන් සංඛ්‍යාව 6,268 ක් වූයෙන් තනතුරු 05 කට අදාළ අතිරික්ත නිලධාරීන් 13 ක් හා තනතුරු 71 ක ට අදාළ පුරප්පාඩු නිලධාරීන් 1,617 ක් පැවතුණි. | පුරප්පාඩු තනතුරු සඳහා බඳවාගැනීම් සිදු කිරීමට අමාත්‍යාංශය දැනුවත් කර ඇති අතර, රජයේ ප්‍රතිපත්තිය මත අත්‍යාවශ පුරප්පාඩු සම්පූර්ණ කිරීම අග්‍රඅමාත්‍ය ලේකම්වරයාගේ සභාපතිත්වයෙන් යුතුව කමිටු නිර්දේශ මත තනතුරු 22 ක පුරපුපාඩු සම්පූර්ණ කිරීම සඳහා අනුමැතිය ලැබී ඇති ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරනු ලබයි. | අදාළ තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කළ යුතුය. |
| (ආ) 2022 දෙසැම්බර් 31 දිනට ශ්‍රේණිගත වෛද්‍යවරුන් සංඛ්‍යාව අනුමත ප්‍රමාණයට වඩා 13 ක අතිරික්තයක් පැවතුණි. වෛද්‍යවරුන් අනුයුක්ත කර ඇති බන්ධනාගාර ආයතනවල රෝහල් වශයෙන් සලකා බැලීමේ දී ශ්‍රේණිගත වෛද්‍ය නිලධාරීන් හා ලියාපදිංචි වෛද්‍ය නිලධාරීන් සංඛ්‍යාවේ පිළිවෙලින් 22 ක් හා 05 ක් වශයෙන් අතිරික්තයක් ද, බන්ධනාගාර ආයතන 08 ක ශ්‍රේණිගත වෛද්‍ය නිලධාරීන් හා ලියාපදිංචි වෛද්‍ය නිලධාරීන් සංඛ්‍යාවේ පිළිවෙලින් 09 ක් හා 05 ක් වශයෙන් පුරප්පාඩු පැවතුණි. | වෛද්‍ය නිලධාරීන් ද සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් අනුයුක්ත කරනු ලබන අතර, මෙම නිලධාරීන්ගේ පුද්ගලික ලිපිගොනු යාවත්කාලීනව කරනු ලබන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශය විසිනි. | වෛද්‍යවරුන් අනුමත නිලධාරීන් සංඛ්‍යාව ඉක්මවා තත්‍ය නිලධාරී සංඛ්‍යාවක් පවත්වාගෙන යා නොගත යුතුය |
| (ඇ) 2022 දෙසැම්බර් 31 දිනට බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ 2014 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාළව ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ පළමු උපලේඛනයේ සඳහන් වරදවල් සම්බන්ධව විනය පරීක්ෂණ 309 ක් ද එම පරිච්ඡේදයේ දෙවන | සිරකරුවන්ගේ ප්‍රමාණය ඉහළ අගයක් ගන්නා බැවින් සිරකරුවන් පැනයාම, නිලධාරී සමඟ ගැටළු ඇති කර ගැනීම සඳහා ද විනය පරීක්ෂණ පැන නගින බැවින් විශාල විනය පරීක්ෂණ සංඛ්‍යාවක් පවතී. 2023 | ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ සඳහන් වරදවල් සම්බන්ධව විනය පරීක්ෂණ පැවැත්වීම, අවසන් කිරීම හා විනය |

| | | |
|---|---|---|
| උප ලේඛනයේ සඳහන් විනය පරීක්ෂණ 113 ක් විය. | වර්ෂයේ සිට අවසන් නොකල විනය පරීක්ෂණ සම්බන්ධයෙන් විධිමත් පරිදි කටයුතු කරන බව විගණනයට දන්වමි. | නියෝග නිකුත් කිරීම අප්‍රමාදව සිදු කළ යුතුය. |
| (ඇ) රාජ්‍ය පරිපාල චක්‍රලේඛ 3/2018 විධිවිධාන පරිදි බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිලධාරීන් දෙදෙනෙකු කොමසාරිස් තනතුරට කොන්ත්‍රාත් පදනම මත 2023 ජනවාරි 02 වන දින සිට 2023 දෙසැම්බර් 30 දින දක්වා හෝ අදාළ පුරප්පාඩු පුරවන ලබන දිනය හෝ යන දින දෙකෙන් කලින් එළෙබෙන දිනය දක්වා නැවත සේවයේ යෙදවීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව අනුමැතිය දී තිබුණි. 2019 ඔක්තෝබර් 10 දිනැති අංක 3/2019 රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛයේ v ඡේදය ප්‍රකාරව හා 2018 පෙබරවාරි 27 දිනැති අංක/18/විවිධ(008) අමාත්‍යමණ්ඩල තීරණය පරිදි උසස්වීම් අපේක්ෂාවෙන් පසුවන නිලධාරීන් මගින් අදාළ පුරප්පාඩුව, වැඩ බැලීම, රාජකාරී ඉටුකිරීම හෝ රාජකාරී ආවරණය මත සම්පූර්ණ කිරීමට හැකියාව තිබියදී කිසිදු විශ්‍රාමික නිලධාරියෙකු නැවත සේවයේ නොයෙදවිය යුතු බව සඳහන් කර ඇත. නමුත් 2023 පෙබරවාරි 22 දින වන විට බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ විශේෂ ශ්‍රේණියේ අධිකාරී තනතුර සඳහා සුදුසුකම් සපුරාලන නිලධාරීන් හත්දෙනෙකු සිටියදි එම නිලධාරීන් අතුරින් සුදුසු නිලධාරීන් දෙදෙනෙකු ඉහත තනතුරුවල පුරප්පාඩු සඳහා වැඩ බැලීම, රාජකාරී ඉටුකිරීම හෝ රාජකාරී ආවරණය මත පත්කිරීමට හැකියාව තිබියදී එපරිදි කටයුතු කර නොතිබුණි. | එම අවස්ථාවේ දී විශේෂ ශ්‍රේණියේ බන්ධනාගාර අධිකාරී තනතුර සඳහා සුදුසුකම් ලත් නිලධාරීන් නොමැති බැවින්, කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් දෙදෙනෙකු බඳවාගෙන ඇති අතර, මේ වන විට විශේෂ ශ්‍රේණියේ බන්ධනාගාර අධිකාරී තනතුරට උසස් කිරීම සඳහා අනුමැතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කර ඇත. | 2019 ඔක්තෝබර් 10 දිනැති අංක 3/2019 රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛයේ v ඡේදය ප්‍රකාරව හා 2018 පෙබරවාරි 27 දිනැති අංක/18/විවිධ(008) අමාත්‍යමණ්ඩල තීරණය පරිදි කටයුතු කළ යුතුය. |
| (ඉ) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යය පරිපාටික රීති අංක 203 ප්‍රකාරව රජයේ නිලධාරියෙකු එකම සේවා ස්ථානයක දිගු කාලයක් අඛණ්ඩව සේවය කිරීම මඟින් හෝ එකම රාජකාරියක් දිගු කාලයක් අඛණ්ඩව ඉටු කිරීම මඟින් සිදුවිය හැකි විශමාචාර ක්‍රියා වැලැක්වීම සඳහා වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්ති හා පටිපාටි සැකසීමේදී සැලකිල්ලට ගත යුතු වේ. නමුත් මහර බන්ධනාගාරයේ හා අනුරාධපුර බන්ධනාගාරයේ පිළිවලින් නිලධාරීන් 96 ක් | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වේ. වසර 05 ක් සේවය කර ඇති නිලධාරීන් හට ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් කටයුතු කර ඇත. | රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යය පරිපාටිය අනුව කටයුතු කළ යුතුය |

හා 20 දෙනෙකු බන්ධනාගාරයට අනුයුක්ත කළ දිනයේ සිට වසර 06 සිට 13 ක් දක්වා කාලයක සිට එම බන්ධනාගාරයේ අඛණ්ඩව සේවය කරන බව විගණනයේ දී නිරීක්ෂණය විය. මෙයින් නිලධාරීන් 09දෙනෙකු මීට පෙරද මහර බන්ධනාගාරයට අනුයුක්තව සේවය කර ඇති බව විගණනයේ දී වැඩිදුරටත් නිරීක්ෂණය විය.